All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 07 | |
| විෂය / பாடம் / Subject | පෙරදිග සංගීතය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I,II | |
| කාලය / நேரம் / Time | පැය 2 | |

නම :- .................................................. විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:
- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් හිමිවේ.

## I කොටස

(01) මන්ද්‍ර , මධ්‍ය , උච්ච යනු,
(1) සප්තකය වේ. (2) ලය වේ.
(3) තාලය වේ. (4) නාද වේ.

(02) 'රි ග ම ධ නි' යනු ස්වර සප්තකයක
(1) කෝමළ ස්වරයන් ය. (2) තීව්‍ර ස්වරයන් ය.
(3) විකෘති ස්වරයන් ය. (4) ප්‍රකෘති ස්වරයන් ය.

(03) 'ස රි ග රි ස' යනුවෙන් ආරම්භ වන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය වනුයේ,
(1) ග ම ප ම ග (2) ග ප ම ග රි (3) රි ග ම ග රි (4) රි ම ප ම ග

(04) / X - X X / X - X X / X - X X / X - X - / ඉහත රිද්ම රටාවට ගැලපෙන ගී පාදය වන්නේ,
(1) බැතිනා සිරිපා කරුණා කරනා (2) ඈත හිමේ ගිරි මුදුනේ
(3) ඈත ඇදී යළි මෑතට පාවේ (4) කඳුපෙළ අතරේ තුරු වදුලේ

(05) ස්වර අභ්‍යාස මත පද නිර්මාණය වී ඇති ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි.
(1) කඳුපෙළ අතරේ තුරු වදුලේ (2) කඳු කඳු නැගෙනා වෙරළෙහි හැපෙනා
(3) මුණි සිරි පාදේ සමනළ මුදුනේ (4) ඈත හිමේ ගිරි මුදුනේ සිසිල මැවෙනවා

(06) කෝළම් ගීත ගායනයේ දී යොදා ගන්නා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,
(1) ගැට බෙරයයි. (2) පහතරට බෙරයයි.
(3) දවුලයි. (4) තම්මැට්ටමයි.

(07) බංකු රබාන වාදනය කරන විශේෂ අවස්ථාවකි.
(1) වෙසක් උත්සවය (2) සිංහල අලුත් අවුරුදු උත්සවය
(3) නත්තල් උත්සවය (4) පොසොන් උත්සවය

(08) 'ස ග ම ප' යන පෙරදිග සංගීත ස්වර අපරදිග ක්‍රමයට හැඳින්වීමේ දී
(1) CDEF (2) CEFG (3) CEGF (4) ABCD වේ.

(09) රබන් පදයකට උචිත ගී පාදයකි.
(1) සවන පිනන ගීත මිහිර (2) හොඳ හොඳ කුක්කන් රජගෙට දක්කන්
(3) ගම්භීර කාලිංග නුවර (4) අතකට ගෙන රබන් පොඩිය

(10) 'දම්වැසි වස්සන ලෝකේ විදුර පඬි' යන ගීතය

(1) නව නාට්‍ය ගීයකි. (2) චිත්‍රපට ගීයකි.

(3) උපදේශාත්මක ගීයකි. (4) නූර්ති ගීයකි.

- පහත වරහන් තුළ ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

( වෙස්මුහුණු , තාලය , ගී අනුවාදන , බටනලා , රාගධාරී , තබ්ලාව , සිතාරය , ළමා ගීතවල )

(11) ........................................ වාදනයේ දී ඇඟිලි 6ක් උපයෝගී වේ.

(12) සංගීතයේ දී මෙන් ම නර්තනයේ දී ද ........................................ ඉතා වැදගත් වේ.

(13) නූර්ති ගීත සඳහා ................................................ සංගීතයේ ආභාෂය ලබා ඇත.

(14) සරල නාද රටා සහ පද මාලාවෙන් යුක්ත වීම ........................................ ඇති විශේෂ ලක්ෂණයකි.

(15) ගීතයේ වචන ශ්‍රවණය වන අයුරින් වාදනය කිරීම .................................... නම් වේ.

- **පහත සඳහන් ප්‍රකාශයන් හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

(16) 'මේ උදාර ලංකා භූමියයි' යනු දේශාභිමානී ගීතයකි. ( )

(17) 'රාමායනය' නූර්තියේ රචකයා වන්නේ චාල්ස් ඩයස් මහතා ය. ( )

(18) දාදරා තාලය මැදුම් තනි තිතට සමානව මාත්‍රා යෙදෙන හින්දුස්ථානි තාලයකි. ( )

(19) 'ආදරේ ඇයි පොඩි හඳ මාමේ' උපදේශාත්මක ගීයකි. ( )

(20) ත්‍රිතාලය මාත්‍රා 4/4 විභාග වන තාලයකි. ( )

(ලකුණු 20)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්න 3න් 2ක් තෝරාගෙන ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.**

(01) පහත A, B, C යටතේ දක්වා ඇත්තේ ඔබ පන්ති කාමරයේ දී ගායනා කරන ලද නාට්‍ය ගීත 3කි.

A දම්වැසි වස්සන

B අඹ දඹ නාරං

C දන්න වංහුං

(1) ඉහත ගීත ඇතුළත් නාට්‍ය වර්ගය කුමක් ද? (ලකුණු 02)

(2) C ගීතය ඇතුළත් නාට්‍යයේ නම ලියන්න. (ලකුණු 02)

(3) C ගීතය ඇතුළත් නාට්‍යයේ නිෂ්පාදකයා කවු ද? (ලකුණු 02)

(4) 'දන්න වංහුං' ගීතයේ ස්ථායි සහ එක් අන්තරා කොටසක් ලියන්න. (ලකුණු 04)

(02) ගී පද නිර්මාණයක මුල් කොටස පහත දැක්වේ.

'අහස පුරා තරු පිරිලා
රැයක අඳුර දුරු වෙනවා'

(1) මෙම ගීතය සඳහා ගැළපෙන තවත් ගී පාද 2ක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(2) තනි තිතෙහි ප්‍රභේද 3 නම් කරන්න. (ලකුණු 03)

(3) මාත්‍රා 3/3 බෙදෙන දේශීය තිතෙහි උඩරට බෙර පදය ප්‍රස්ථාර කරන්න. (ලකුණු 03)

(03) 7 ශ්‍රේණියේ දී ඔබ උගත් ගී වර්ග සහ ගී පාදයන් පහත වගුවේ දැක්වේ.

| | ගී වර්ගය | ගී පාදය |
|---|---|---|
| A | නැළවිලි ගී | .................................................................. |
| B | .................................. | අතකට ගෙන රබන් පොඩිය |
| C | .................................. | සන්තානම් පල්ලි යන්න |
| D | උපදේශාත්මක ගී | .................................................................. |
| E | .................................. | අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි |
| F | කෝළම් ගී | .................................................................. |

(1) ඉහත වගුවෙහි හිස්තැන් පුරවන්න. (ලකුණු 06)

(2) A B C ගී වර්ගවලින් එක් ගී වර්ගයක් පිළිබඳ සුවිශේෂ කරුණු 2ක් ලියන්න. (ලකුණු 02)

(3) කෝළම් නාට්‍ය පිළිබඳ විශේෂ කරුණු 2ක් ලියන්න. (ලකුණු 02)

National e-learning Portal for The General Education

(04) 'ග්‍රහ' යනු ග්‍රහණය කර ගැනීම හෙවත් අල්ලා ගැනීමයි. ගීතයක් ගායනය හෝ වාදනය කිරීමේ දී ග්‍රහ වර්ග 3කට අනුව එය සිදුවේ.

(1) සමග්‍රහ සහ විෂමග්‍රහ නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(2) අවග්‍රහ යනු කුමක් ද? (ලකුණු 02)

(3) අවග්‍රහයෙන් ගැයෙන ගී පාදයක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 02)

221